# ලංසු සඳහා ආරාධනයයි (IFB)
# නාගරික සංවර්ධන අධිකාරිය
# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

1. නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා විසින් පහත වගුවේ දැක්වෙන මහා මාර්ග ඉදිකිරීම සඳහා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අංකය | ටෙන්ඩර් අංකය | ව්‍යාපෘතියේ නම | බදු රහිත ටෙන්ඩර් මුදල (රු.) | අවම ICTAD ශ්‍රේණිය | ව්‍යාපෘති කාලසීමාව (දින) | රඳවා ගැනීමේ කාලය (දින) | ටෙන්ඩර් ගාස්තුව (ආපසු නොගෙවනු ලබන - බදු ඇතුළත් නොවේ.) (රු.) | ලංසු බැඳුම්කර වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 53/04/126-1-2024 | කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායකයන් සඳහා (SME) වූ කර්මාන්තපුරයේ සංවර්ධනය සඳහා යෝජිත මාර්ග ජාලය ඉදිකිරීමේ ව්‍යාපෘතිය මිල්ලෑවවත්ත - පාදුක්ක | 221,132,540.94 | C-2 (මාර්ග ඉදිකිරීම්) | 270 | 365 | 50,000.00 | 3,317,000.00 |

2. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරු අසාධු ලේඛණගත නොවී සිටිය යුතු වන අතර, අදාළ මුදල් කොන්ත්‍රාත්තුව සඳහා දක්වා ඇති පරිදි CIDA (ICTAD) ලියාපදිංචි අවශ්‍යතාවය සපුරාලිය යුතුය.
3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, ලංසුකරු විසින් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 වැනි ඡේදය යටතේ සමාගම් ලේඛනය මගින් නිකුත් කරන ලද සහතිකය ඉදිරිපත් කළ යුතුය.
4. මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් වැඩිදුර තොරතුරු බත්තරමුල්ල, සෙත්සිරිපාය - අදියර I, 8 වන මහල, නාගරික සංවර්ධන අධිකාරියේ, "දේපළ කළමණාකරණය හා සංවර්ධන අංශය" වෙතින් 2024 ජුලි මස 17 වන දින සිට 2024 අගෝස්තු 30 වන දින ප.ව. 2.45 දක්වා සතියේ වැඩ කරන දිනයන්වල, රාජකාරි වේලාවන් තුළදී ලංසු ලේඛණ පරීක්ෂා කර බැලිය හැක.(දු.අං. 011 2875921, 011-3611950, හෝ 011-2875916-20, දිගුව: 2960-2967, ෆැක්ස්: 011-2875900, විද්‍යුත් තැපෑල: directorred@uda.gov.lk
5. ආපසු නොගෙවනු ලබන රු. 50,000.00 ක මුදලක් (බදු ඇතුළත් නොවේ.) බත්තරමුල්ල, සෙත්සිරිපාය - අදියර I, 6 වන මහල, නාගරික සංවර්ධන අධිකාරියේ, "මුදල් අංශය" වෙත ගෙවීමෙන් අනතුරුව බත්තරමුල්ල, සෙත්සිරිපාය - අදියර I, 8 වන මහල, නාගරික සංවර්ධන අධිකාරියේ, "දේපළ කළමණාකරණය හා සංවර්ධන අංශය" වෙතින් 2024 ජුලි මස 17 වන දින සිට 2024 අගෝස්තු මස 30 වන දින දක්වා සතියේ වැඩ කරන දිනයන්වල, පෙ.ව. 9.00 සිට ප.ව. 2.45 දක්වා ඉංග්‍රීසි බසින් සකස් කරන ලද ලිඛිත ලංසු අයදුම්පත ලබා ගත හැකිය. ගෙවීම් සිදු කල හැක්කේ මුදලින් පමණි.
6. සම්පූර්ණ කරන ලද මුද්‍රා තැබූ ලංසු ලේඛණ ලිපි කවර දෙකකට සැකසිය යුතු අතර, ඉන් ලියුම් කවර අංක 01- ***Technical Qualification Information*** හා ලියුම් කවර අංක 02 - ***Financial Bid*** ලෙස ඉංග්‍රීසි බසින් සටහන් තබා මුද්‍රා තැබිය යුතුව ඇත. ඉන් පසුව වෙන් වෙන් වශයෙන් සැකසූ ලිපි කවර දෙක එක් ලියුම් කවරයක බහා එහි වම් පස ඉහළ කෙළවරෙහි **"Construction of proposed Road Network for the Small and Medium Sized Enterprises (SME) Industrial Park Development project at Millewawatta, Padukka"** සඳහන් කර **"Chairman, Ministry Procurement Committee, Ministry of Urban Development and Housing, 12th Floor, Sethsiripaya Stage II,Battaramulla"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාර දිය යුතුය. සියලු ලංසු **2024 සැප්තැම්බර් මස 10 වන දින ප.ව. 2.00** ට හෝ ඊට **ප්‍රථම භාර දිය යුතුය**. ප්‍රමාද වී ලැබෙන හා විද්‍යුත් තැපෑල මාර්ගයෙන් යොමු කරන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු ඇපකර සහතිකය (Bid Security) ලියුම් කවර අංක 01 හි ***(Technical Qualification Information)*** ඇතුළත්ව තිබිය යුතුය.
7. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම ලංසු කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කිරීම කරනු ලැබේ. මෙසේ විවෘත කරනුයේ ලංසුකරුවන්ගේ ලියුම් කවර අංක 01 ***(Technical Qualification Information)*** පමණක් බවත්, ලියුම් කවර අංක 02 ඇතුළත් ***Financial Bid*** විවෘත කරනු නොලැබේ.
8. තාක්ෂණික ඇගයීම අවසන් වූ පසු, "ලියුම් කවර අංක 02"***(Financial Bid)*** විවෘත කරන වේලාව සහ දිනය ලිඛිතව සුදුසුකම් ලබා ඇති ලංසුකරුවන්ට දැනුම් දෙනු ලැබේ. තවද "ලියුම් කවර අංක 02" විවෘත කිරීම තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලත් ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ සිදු කෙරේ.
9. මූල්‍ය ලංසුව ***(Financial Bid)*** විවෘත කිරීම සඳහා සුදුසුකම් නොලබන ලංසුකරුවන් වෙත ඔවුන්ගේ ලියුම් කවර අංක 02 ***(Financial Bid)*** විවෘත නොකර ඔවුන් වෙත ආපසු දෙනු ලැබේ.
10. ලංසු ඉදිරිපත් කිරීමට නියමිත කාලය අවසන් වූ වහාම ලංසු කරුවන් සහ/හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.
11. ඉදිරිපත් කරන ලද ලංසුවල වලංගු කාලය වන්නේ අදාල ලංසු විවෘත කරන දින සිට දින 91 ක් දක්වා පමණි.
12. ඉහත වගු අංක 01 හි දක්වා ඇති පරිදි ලංසු ඇපකරය සමඟ ලංසුව ඉදිරිපත් කළ යුතුය. ලංසු ලේඛනවල දක්වා ඇති සම්මත ආකෘතිය භාවිතා කරමින් බැංකු ඇපකරයක ආකාරයෙන් ඉදිරිපත් කරන ලංසු ඇපකරය 2024 දෙසැම්බර් 10 දින දක්වා පමණක් වලංගු වේ.
13. ලංසු සකස් කිරීම සහ භාරදීම සම්බන්ධයෙන් ලංසුකරුවන් විසින් දරනු ලබන යම් පිරිවැයක් හෝ වියදම් සඳහා ප්‍රසම්පාදන කමිටුව කිසිදු වගකීමක් දරනු නොලැබේ.
14. ප්‍රසම්පාදන කමිටුවට ලැබෙන ඕනෑම ලංසුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව අවසාන තීරණයකට එලඹීමට ඇති අයිතිය එම කමිටුව සතු වේ.
15. පූර්ව ලංසු රැස්වීම 2024 අගෝස්තු මස 21 වන දින පෙ.ව 10.00 ට ,බත්තරමුල්ල, සෙත්සිරිපාය - අදියර I, 9 වන මහල පිහිටි නාගරික සංවර්ධන අධිකාරියේ ශ්‍රවනාගාරයේදී පැවැත්වේ.

**සභාපති**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**12 වන මහල, සෙත්සිරිපාය අදියර - II,**
**බත්තරමුල්ල.**